// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1942/2 - 2015 නොවැම්බර් මස 23 වැනි සඳුදා - 2015.11.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය*: මහර/සං/2/208.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: එල්ඩී/05/2005/එච්ඩබ්ලිව්/275.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අධිකාරි පත්තුව සුළු කොට්ඨාශයේ, රම්මුතුගල ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කර ඇති ගම්: 3972 සහ 2015. 07. 30 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 සිට 02 දක්වා පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0025 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි දෙක (2):

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: ගොඩපොරගහදෙණිය; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එම්. ඒ. ඩබ්. මුණසිංහ, අංක: 589/4, රම්මුතුගල, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0022.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: රම්මුතුගලවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සීමාසහිත දොන් නීටින් ගාමන්ට් ඉන්ඩස්ට්‍රීස් සමාගම, අංක: 588/2, රම්මුතුගල, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0003.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2015.12.28 දින පූ.භා. 10.00ට මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2015.12.21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම්/ පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

සී. පී. ඩබ්ලිව්. ගුණතිලක
ප්‍රාදේශීය ලේකම්,
මහර.

2015 නොවැම්බර් මස 16 වැනි දින,
මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.
රම්මුතුලගල, කඩවත.

12 - 265

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : සිය/ප්‍රා ලේ/ආ සං/02/03/01.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4/3/4/2010/ඩී/303.

මහකළුගොල්ල පොලිස් මුරපොල සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පල්ලේගම ගමේ පිහිටි, මොනරාගල මැනුම් අධිකාරි විසින් පිළියෙල කර ඇති කැඩැස්තර සිතියම් අංක 720002, කලාප අංක 04, පත්‍ර අංක 36 හි දැක්වෙන ඉඩම් කැබලි.

මුළු ප්‍රමාණය: හෙක්ටයාර් 1.6378
ඉඩමේ නම: බුරුතගහවත්ත

01. **කැබලි අංක 329**
ඉඩමේ නම: –; ඉඩමේ විස්තරය: –; හිමිකම් කියන අය: රජය; අනවසරකරු: කේ. කේ. එම්. ගුණවතී, මහකළුගොල්ල, සියඹලාණ්ඩුව; ප්‍රමාණය: හෙක්. 1.0692.

02. **කැබලි අංක 330**
ඉඩමේ නම: –; ඉඩමේ විස්තරය: –; හිමිකම් කියන අය: කේ. කේ. එම්. ගුණවතී, මහකළුගොල්ල, සියඹලාණ්ඩුව; ප්‍රමාණය: හෙක්. 0.5225.

03. **කැබලි අංක 333**
ඉඩමේ නම: –; ඉඩමේ විස්තරය: –; හිමිකම් කියන අය: කේ. කේ. එම්. ගුණවතී, මහකළුගොල්ල, සියඹලාණ්ඩුව; ප්‍රමාණය: හෙක්. 0.0461.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් 2016 ජනවාරි මස 19 වැනි දින පෙ.ව. 10.00ට සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2016 ජනවාරි මස 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඒ. එම්. නන්දසිරි,
ප්‍රාදේශීය ලේකම්,
සියඹලාණ්ඩුව.

2015 නොවැම්බර් මස 17 වැනි දින,
සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 279

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.